WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I, II |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) (අ) දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මවන ලද්දේ කුමකින් ද?

(ආ) ඔවුනට ජීවනය දීම සඳහා එතුමාණන් කුමක් කළ සේක ද?

(ii) "නුඹේ මව්බිම ද නෑදැයන් ද, නුඹේ පියාණන්ගේ ගෘහය ද අතහැර දමා මා පෙන්වන දේශයට යන්න."

(අ) මෙසේ පවසන ලද්දේ කා හට ද?

(ආ) එසේ යන ලද පුද්ගලයාගේ කුමන ගුණාංගයක් ඉස්මතුවේ ද?

(iii) ජේසුස් වහන්සේ උගන්වන ලද ස්වාමින්ගේ යාච්ඤාවේ ඇති පව් කමාව පිළිබඳ වැදගත් අංග **දෙක** සඳහන් කරන්න.

(iv) මෙසියස්තුමාගේ පැමිණීම ප්‍රකාශ කළ දිවැසිවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.

(v) (අ) 'එමානුවෙල්' යන නම කුමන බසකින් පැවත එන්නේ ද?

(ආ) එහි අර්ථය කුමක් ද?

(vi) ජුදෙව් ආගමික කණ්ඩායම් අතර පුනරුජ්ජීවනය නොපිළිගන්නා **එක්** කණ්ඩායමක් සහ පුනරුජ්ජීවනය පිළිගන්නා **එක්** කණ්ඩායමක් බැගින් නම් කරන්න.

(vii) (අ) රාත්‍රි කාලයේ ජේසුස් වහන්සේ හමුවීමට ආගමික නායකයෙකු පැමිණියේ ය. ඔහුගේ නම කුමක් ද?

(ආ) ඔහු කුමන ජුදෙව් කණ්ඩායමට අයත් වේ ද?

(viii) (අ) ශුද්ධ ජොහාන්ගේ සුබසුනේ 4 වන පරිච්ඡේදයේ ජේසුස් වහන්සේ ජාතික හා වාර්ගික බාධක අභිබවා ක්‍රියාකළ අවස්ථාවක් සඳහන් වේ. ජේසුස් වහන්සේ ඉල්ලුවේ කුමක් ද?

(ආ) එතුමාට ලැබුණු මූලික ප්‍රතිචාරය කුමක් වී ද?

(ix) ශුද්ධ ජොහාන්ගේ සුබසුනේ 4 වන පරිච්ඡේදයේ ඉදිරිපත් කෙරෙන, එවකට ජුදෙව් සමාජයේ පැවති ජේසුස් වහන්සේ මුහුණ දුන් ජාති භේද හා ලිංග භේද කුමක් වී ද?

(x) අපට සදාතන ජීවිතය ලැබෙන්නේ ජේසුස් වහන්සේගෙන් ය. අපේ ජීවිත පරිවර්තනයක් මගින් තිබිය යුතු ගුණාංග **දෙකක්** ඉදිරිපත් කරන්න.

**2.** (i) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමා **දෙක** කුමක් ද?

(ii) එම උපමා මගින් අප වෙත ඉදිරිපත් කෙරෙන ඉගැන්වීම් **තුනක්** සඳහන් කරන්න.

(iii) වර්තමානයේ කිතුනු ජනයා ලෝකයේ සෙසු අය සමග සබඳතා පැවැත්වීමේදී කෙසේ ක්‍රියා කළ යුතු දැයි දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති **පහක්** ඇසුරෙන් පැහැදන්න.

[හත්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**3.** (i) ලූක් සුබසුන අනුව ගෙනසෙරත් විල අසලදී ජේසුස් වහන්සේ කැඳ වූ ගෝලයන් **දෙදෙනෙකු** නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේ ගෝලයන් දොළොස්දෙනා කැඳවන අවස්ථාවේදී, ඔවුන් අතුරෙන් **තිදෙනෙකු** කුමන රැකියාවල නිරත වී සිටියේ දැයි සඳහන් කරන්න.

(iii) 'අපෝස්තුලු/ප්‍රේරිත' යන වචනයේ අර්ථය ලියා, අද සමාජයට එහි වැදගත්කම කුමක් දැයි කරුණු **හතරක්** ඇසුරෙන් විස්තර කරන්න.

**4.** (i) මිටියාවතේ දේශනාවෙන් ජේසුස් වහන්සේ ඉදිරිපත් කරන ප්‍රතිවිරුද්ධ ජීවන රටා **දෙක** කුමක් ද?

(ii) කිතුනුවන් වශයෙන් එම දේශනය අනුව අප ජීවිත හැඩගස්වා ගත යුතු අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) සමකාලීන ශ්‍රී ලංකාවේ වෙසෙන කිතුනුවන් වශයෙන් ශුද්ධ ලියවිලි කියවීමෙන් හා මිටියාවතේ දේශනයෙන් අප ජීවිත හැඩගස්වා ගැනීමට උපකාරී වූ අන්දම පිළිබඳ කරුණු **පහක්** ඉදිරිපත් කරන්න.

**5.** (i) දෛනික ජීවිතයේදී අපට උපකාරී වන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව අප ජීවිත හැඩගස්වා ගතයුත්තේ මන්දැයි දක්වා, එමගින් අපට ලබාගත හැකි ප්‍රතිඵල **තුනක්** ලියන්න.

(iii) විකල්ප ජීවන රටාවක් ළඟා කර ගැනීමට කිතුනු අප විසින් මූලිකත්වය දිය යුතු අංශ **පහක්** විස්තර සහිතව පහදන්න.

**6.** (i)
- පාවුල්තුමාගේ පළමු වන ධර්ම දූත සේවය ඇරඹුවේ කුමන නගරයෙන් ද?
- ගමන් ආරම්භයට පෙර එහි සමූහයා කළේ කුමක් ද?

(ii) පාවුල්තුමාගේ දෙවන ධර්ම දූත චාරිකාවේදී ගිය ස්ථාන **තුනක්** සඳහන් කර, ඔහු සමග ගමන් ගත් හෝ උපකාර කළ පුද්ගලයන් **තිදෙනෙකු** නම් කරන්න.

(iii) පාවුල්තුමාට මෙම චාරිකාවලදී විවිධ පුද්ගලයන් සමග සහ විවිධ අවස්ථාවන්ට මුහුණ දීමට සිදුවිය. පහත සඳහන් අය අතුරෙන් එක් පුද්ගලයෙකු තෝරාගෙන, එම පුද්ගලයා මුණගැසුණ අවස්ථාවේදී පාවුලුතුමා ක්‍රියා කළ ආකාරයෙන් වත්මන් ශ්‍රී ලංකාවේ ධර්මදූත සේවයෙන් සුබසුන ප්‍රකාශ කිරීමේදී ගත යුතු මඟපෙන්වීම කුමක් දැයි පැහැදිලි කරන්න.

(අ) එලිමස්

(ආ) ඊර්ෂ්‍යා කළ යුදෙව්වන්

(ඉ) වහල් කාන්තාව හිමිකරගෙන සිටි අය

(ඊ) එපිකූරි සහ ස්තොයික දාර්ශනිකයන්

WWW.OLEVELAPI.COM

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරන්න.

(i) පෙරමග දූතයා

– පෙරමග දූතයා ලෙස නම් කෙරුණ පුද්ගලයා සහ ඔවුන්ගේ කාර්යභාරය

– මොහු සිය කාලය වැඩි වශයෙන් ගතකළ පරිසරය

– මොහුට සවන් දීමට පැමිණි කණ්ඩායම් හා ඔවුනට දුන් අවවාද

– එම පැමිණි ජනතාවගේ අවධානය යොමු කළේ කවුරුන් හටද යන්න

– මොහුගේ චරිතය සහ පණිවුඩය අද අපට වැදගත් වන අන්දම

(ii) ජුදෙව් චාරිත්‍ර

– ජේසුස් වහන්සේගේ කාලයේ පැවති විවිධ ජුදෙව් චාරිත්‍ර

– ජේසුස් වහන්සේගේ දෙමාපියන් බිළිඳු ජේසුතුමා සඳහා ඉටුකළ චාරිත්‍ර සහ වයස අවු. 12දී ඉටු කළ චාරිත්‍ර

– බිළිඳෙකු ලෙස දෙව් මැදුරට ජේසුතුමා ගෙනගිය අවස්ථාවේ එහි සිටි පුද්ගලයන් දෙදෙනා

– මොවුන් බිළිඳු ජේසුතුමා හා මරියතුමියට කරන ලද ප්‍රකාශ

– 12 හැවිරිදි ජේසුස්තුමා ජුදෙව් නායකයන් සංවාදයේ යෙදී සිටි අවස්ථාවේ සිය දෙමාපියන් හට දැක්වූ ප්‍රතිචාරය අද දින අපට වැදගත් වන අන්දම

(iii) දේව දූතයන්ගේ මෙහෙවර

– දේව දූත මෙහෙවර ලැබූ පුද්ගලයන් සහ කණ්ඩායම

– ඉටු කළ මෙහෙවර සහ ඒ හා බැඳි අවස්ථා

– ඉදිරිපත් කළ පණිවුඩ

– දේව දූත මෙහෙවර ලැබූ පුද්ගලයන් හා කණ්ඩායම් දැක් වූ ප්‍රතිචාර

– අද දේව දූතයන් වශයෙන් අප හඳුනා ගන්නා පුද්ගලයන් සහ ඔවුන්ගේ දූත මෙහෙවර

(iv) නාසරත් සිනගෝගයේ දේශනය

– නාසරත් සිනගෝගයේ දේශනයේ විශේෂත්වය

– දේශනයේ සඳහන් සමාජ කණ්ඩායම් කෙරෙහි දැක් වූ බලපෑම

– පැරණි ගිවිසුමේ පුද්ගලයන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම මගින් එතුමා සවන්දී සිටි ජනතාවට දෙනු ලැබූ පණිවුඩය

– දේශනයට සවන් දුන් සිනගෝගයේ ජනයාගේ ප්‍රතිචාරය

– මෙම දේශනයට අනුව අද සමාජයේ සේවය කළ යුතු ජන කණ්ඩායම්

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...